**කහවත්ත ප්‍රාදේශීය සභාව - 2020**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කහවත්ත ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කහවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල ඉටු කරන ලද එකතුව රු.3,298,821 ක් වූ සංවර්ධන ව්‍යාපෘති වියදම ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් ඉඩම් හා ගොඩනැගිලි ගිණුමේ සහ ප්‍රාග්ධනයට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | 2021 අවසන් ගිණුම සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සංවර්ධන ව්‍යාපෘති වියදම් ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ වෙන්දේසි කරන ලද එකතුව රු. 5,244,973 ක ස්ථාවර වත්කම් පිරිවැය ගිණුම්වලින් ඉවත් නොකිරීම හේතුවෙන් ජංගම නොවන වත්කම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 ගිණුම සකස් කිරීමේ දී නිවැරදි කරන බව. | ඉවත් කරන ලද වත්කම් වටිනාකම ලෙජර් ගිණුම්වලින් ඉවත් කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී ඉඩම් වෙන්දේසියකින් අත්පත් කරගන්නා ලද රු. 4,312,500 ක් වටිනා ඉඩම ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ඉඩම් හා ගොඩනැගිලි සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 ගිණුම සකස් කිරීමේ දී නිවැරදි කරන බව. | අත්පත් කරගත් ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාල කර්මාන්ත, ව්‍යාපාර බදු බිල්කිරීම් රු. 72,410 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 ගිණුම සකස් කිරීමේ දී නිවැරදි කරන බව. | වර්ෂයට අදාල ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | කොරෝනා රෝග මර්දනයට ලද මුදල වූ රු. 100,000 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස නොගලපා සමුච්චිත අරමුදලට ගැලපීම හේතුවෙන් සමුච්චිත අරමුදල එම වටිනාකමින් වැඩියෙන් හා වර්ෂයේ අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 ගිණුම සකස් කිරීමේ දී නිවැරදි කරන බව. | වර්ෂයට අදාල ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.1,978,222 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් තොරතුරු සොයා ගැනීමට හැකි වී නොමැති බව. | ගිණුම් ශේෂ සනාථ කර ගැනීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 (5) | 2011 සිට 2020 දක්වා වූ කාලපරිච්ඡේදය තුල අවස්ථා 04 කදී ලබාදී තිබූ එකතුව රු.1,086,991 ක් වූ අත්තිකාරම් පියවා නොතිබුණි. | 2021 අප්‍රේල් 16 දින දක්වා අත්තිකාරම් පියවා නොමැති බව. | අත්තිකාරම් මුදල් අදාල කාර්යය අවසන් වූ විගසම පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,016,690 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,222,608 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් ඒකක 1340 කට අදාලව රු.1,353,985 ක හිඟයක් පැවතුණු අතර, එම හිඟ ශේෂය අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | දීර්ඝකාලීනව හිඟව පවතින හඳුනාගත නොහැකි වරිපනම් දේපල කිහිපයක වරිපනම් හිඟය පොත් වලින් කපාහැරීම සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සඳහා යොමුකර ඇති බවත්, පවත්නා වසංගත තත්ත්වය සැලකිල්ලට ගනිමින් මෙම වසරේදී දේපල තහනම් කිරීම සඳහා කටයුතු නොකරන ලද බව. | |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසන් වනවිට අක්කර බදු ඒකක 151 කින් අයවිය යුතුව පැවති අක්කර බදු ශේෂය රු. 68,886 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | හිඟ අක්කර බදු මුදල් අයකර ගැනීම සඳහා අදාල දේපල හිමියන්ට ලිපි මඟින් දන්වා ඇති අතර අක්කර බදු සමීක්ෂණය මඟින් හඳුනාගත් බෙදුනු ඉඩම් ලේඛන වලින් ඉවත් කිරීම සඳහා කටයුතු කරමින් පවතින බව. | සභාවට අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**(ආ) කුලී**

-----

| | | |
|---|---|---|
| වර්ෂ 01 සහ 03 ක කාලයක් හිඟව ඇති සභාව සතු අංක 41 සහ අංක 42 කඩකාමරවලින් අයවිය යුතු රු.108,410 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අයකරගෙන නොතිබුණි. | මුදල් නොගෙවන කඩ කාමර සභාවට පවරා ගැනීමට කටයුතු සැලසුම් කර ඇති බව. | සභාවට අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගත යුතුය. |

**(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු**

------------------------------

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2020 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා අයවිය යුතු මුද්දර ගාස්තු වටිනාකම රු.4,303,100 ක් අයකරගෙන නොතිබුණි. | 2019 අවසන් අර්ධ වර්ෂයේ හා 2020 වර්ෂයේ උපලේඛන නොලැබීම හේතුවෙන් මුද්දර ගාස්තු වටිනාකම හඳුනා ගැනීමට නොහැකිවී ඇති බව. | වර්ෂය වෙනුවෙන් අයවිය යුතු ආදායම හඳුනාගෙන අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඇන්දාන නගර සංවර්ධන යෝජනා ක්‍රමය සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු අක්කර 10 ක භූමි ප්‍රමාණයක් කහවත්ත සංවර්ධන සහා උප කාර්යාලය වෙත 1985 දෙසැම්බර් 05 දිනැතිව භුක්තිය භාරදී තිබුණද, සභාව විසින් එහි හිමිකම ලිඛිතව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. වර්තමානය වනවිට එම ඉඩමෙන් අක්කර 07 ක පමණ ප්‍රමාණයක් බාහිර පාර්ශව විසින් අත්පත් කරගෙන තිබූ අතර, ඉතිරිව පවතින අක්කර 03 ක් පමණ වූ භූමිය හෝ සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩම් කොටස ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඔප්පුවක් මඟින් සභාව වෙත ලබා නොදීම හා ඔවුන් විසින් වරින්වර වෙනත් පුද්ගලයන් සඳහා නව ඔප්පු ලබාදීම නිසා වර්තමානය වනවිට ඇන්දාන නගරයේ සංවර්ධන කටයුතු සිදු කිරීම අපහසු වී ඇති බව. | සභාවට අයිති භූමි ප්‍රමාණය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2019 දෙසැම්බර් 12 දිනැති සභා තීරණ අංක 7.35 මඟින් ලබාදී තිබූ අනුමැතිය මත 2020 වර්ෂය සඳහා දිනපොත් 268 ක් මුද්‍රණය වෙනුවෙන් රු. 140,900 ක් වැයකර තිබුණි. | දිනපොත් සභාපතිතුමා, මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමා, සභාවේ කාර්යය මණ්ඩලය හා වෙනත් රාජ්‍ය ආයතන හා බැංකු සඳහා බෙදා දී ඇති බව. | සභා අරමුදල් යෙදවීම ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය අනුව සිදුකළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

**4.1 පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල සමාලෝචිත වර්ෂයේදී ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 840 ක් පමණ බැහැර කිරීම සඳහා රු. 10,263,475 ක පිරිවැයක්, කාර්යය මණ්ඩල සේවකයින් 15 දෙනෙකු ද වාහන සහ යන්ත්‍ර උපකරණ 02 ක් ද යොදවා තිබුණි. එසේ වුවද, එම අපද්‍රව්‍ය බැහැර කිරීම විධිමත් හා පරිසර හිතකාමී ක්‍රමවේදයකින් බැහැරව භූමියේ වලවල් හාරා ඒ තුළ අපද්‍රව්‍ය බැහැර කර වලවල් වසා දැමීම මඟින් පාරිසරික ගැටළු රාශියක් මතුවී තිබුණි. | ඉඩම පවරා ගැනීමට ඉල්ලීම් සිදු කළද, ඉඩම පවරා ගැනීමට හැකියාවක් ලැබී නැත. එම නිසා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම සකස් කර සහා අනුමැතිය ලබාගෙන ඇතත්, එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇති බව. | සභා බල ප්‍රදේශය තුළ කසළ කළමනාකරණ සැලැස්මක් සකසා ක්‍රියාත්මක කළ යුතුය. |